''නැණ සිළු - 2025''

පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස් වන ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන විභාගය

කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - කුරුණෑගල

කට්ටල අංක - 02

I පත්‍රය

විභාග අංකය : .....

කාලය - පැය 01 යි

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් .....

- ඔබගේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	

පිටු අංකය	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි.	V / II / S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි.	V / II / S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණ සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි.	V / II / S / EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය.	V / II / S / CH

සැකසුම :- නන්දන රත්නායක - 071 8177327

තුෂාර සරත් කුමාර - 077 5154357

කු/ වැල්ලව මධ්‍ය මහා විද්‍යාලය

- 01 සහ 02 ප්‍රශ්නවල මුලින් දී ඇති රූපසටහන පිළිබඳ ගැළපෙන ප්‍රකාශය තෝරන්න.

01.



1) උදෑසන දර්ශනයකි.
2) සවස් කාලයේ දර්ශනයකි.
3) ගංගාවක දර්ශනයකි.

02.



1) ළමයි පාසලට යති.
2) පාසල් ළමයි පාරේ යති.
3) ළමයි පාසල ඇරී එති.

03. කාණ්ඩ තුනකට අයත් රූප ඇතුළත් කොටුව තෝරන්න.



(1)



(2)



(3)

04. පහත සටහනෙහි හිස්තැන් සඳහා වඩාත් සුදුසු වචන පිළිවෙළින් ඇතුළත් පිළිතුර කුමක් ද?

.....	කඳු	ගංගා
මහනුවර	.....	වලවේ
දඹුල්ල	පිදුරුතලාගල	.....

(1) නගර, නකල්ස්, මහවැලි

(2) කුරුණෑගල, බඹර කන්ද, කැලණි

(3) කොළඹ, රිටිගල, කැලණි

05. පහත කවියෙන් කියවෙන්නේ කවුරුන්ගැන ද?

මැටි කළය බිඳුණොත්
නැත එහි අගය මදකුත්
අකීකරු දරුවොත්
එසේමය එපමණ ද නොවටිත්

(1) ළමයි (2) දරුවෝ (3) අකීකරු දරුවෝ


06. සිද්ධියක අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

a) එළුවා රැගෙන මෙගොඩට එනවා
b) එළුවා මෙගොඩ තබා කොටියා රැගෙන යනවා.
c) තම්පලා මිටිය රැගෙන ගොස් එගොඩ තබනවා.
d) එළුවා රැගෙන එගොඩට යනවා.
e) ආපසු මොගොඩට ඇවිත් එළුවා රැගෙන යනවා.


ඒවායේ නිවැරදි පෙළගැස්ම කුමක් ද?

(1) a c d b e (2) d c a b e (3) d a c b e


07. සාරි, කලිසම්, ඇඳුම් අතර සම්බන්ධතාව වඩාත් හොඳින් නිරූපණය කළ හැකි රූපය තෝරන්න.



(1)




(2)



(3)

08. මෙහි දැක්වෙන රූපයේ ජල කරාමය විවෘත කළවිට මුලින්ම ජලය පිරී ඉතිරී යන භාජනය තෝරන්න.




(1) A (2) B (3) C

09. පහත වරහන් තුළ දී ඇති ප්‍රකාශ අතරින් නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

(1) (135, 81) (2) (212, 25) (3) (451, 49)

10. පහත දැක්වෙන බර සටහනට අනුව හිස්තැනට තිබිය යුතු අගය සොයන්න.



(1) 100g (2) 105g (3) 115g

11. පිටු 80ක් ඇති පොතක මැදින් කටු ගසා ඇත. එහි 25 වන කොළය කැඩී ගියේ නම්, ඒත් සමඟ ගැළවී යන අනෙක් පස කොළයේ පිටු අංක විය හැක්කේ,

(1) 30,31 (2) 31, 32 (3) 32, 33


12. තේනුක ළඟ ඇති පෑන් වලින් 7ක් හැර ඉතිරි ඒවා රතු පාටය. 9ක් හැර ඉතිරි ඒවා නිල් පාටය. 8ක් හැර ඉතිරි ඒවා කළු පාටය. තේනුක ළඟ ඇති නිල් පෑන් ගණන කීයද?

(1) 3 (2) 4 (3) 5

13. පේර ගෙඩියන මිළ රු. 80.00 කි. දොඩම් ගෙඩියක මිල රු.100.00කි. පේර හා දොඩම් දෙවර්ගයෙන්ම යම් සංඛ්‍යාවක් මිලදී ගැනීමට කවීෂාට වැය වූ මුදල රු. 700.00 කි. කවීෂා මිලට ගත් පේර ගෙඩි ගණන කීයද?

(1) 3 (2) 4 (3) 5

14. පහත දී ඇති රූපයේ අවසාන තරාදියේ බර සමාන වීමට හිස්තැන සහිත ස්ථානයට වෘත්ත කීයක් තිබිය යුතුද?




(1) 4 (2) 5 (3) 6

15. සේවකයින් නිදෙනෙකු පැය එකකදී කාමර තුනක තීන්ත ගා අවසන් කරයි. පැය තුනක දී කාමර 18 ක තීන්ත ගා අවසන් කිරීමට සේවකයින් කී දෙනෙකු අවශ්‍යවේද?

(1) 6 (2) 8 (3) 9

16. පහත රූපයේ දැක්වෙන්නේ එකම ඝනකයක විවිධ පිහිටීම් අවස්ථා හතරකි. ඒ අනුව මලට (✸)විරුද්ධ පැත්තේ ඇති රූපය කුමක්ද?



(1) △ (2) ☆ (3) ○

17. පහත රූපයේ දැක්වෙන භාජන දෙක භාවිතාකර විශාල භාජනයට ජලය ලීටර 8ක් මැන ගැනීමට භාජන දෙක අතර අවම වශයෙන් ජලය කීවරක් හුවමාරු කළ යුතු ද?



(1) 5 (2) 6 (3) 7

18. මෙතුලිගේ ඔරලෝසුවේ වේලාව සෑම පැයකටම මිනිත්තු 10ක් වැඩියෙන් ද, කවීෂාගේ ඔරලෝසුවේ වේලාව සෑම පැයකටම මිනිත්තු 5ක් අඩුවෙන්ද ගමන් කරයි. දෙදෙනාම පෙ.ව. 10.00 ට තම ඔරලෝසුවේ වේලාව නිවැරදිව සකසා ගත්තේ නම්, ප.ව.1.00 වන විට දෙදෙනාගේ ඔරලෝසු දෙකෙහි දැක්වෙන වේලාවන් අතර වෙනස මිනිත්තු කීයද?

(1) මිනිත්තු 15 (2) මිනිත්තු 30 (3) මිනිත්තු 45

19. නිමල්, කමල්ගේ තාත්තාය. සුනිල් නිමල්ගේ බාල සහෝදරයා ය. සීතා කමල්ගේ එකම නැගනියයි. සීතාත් සුනිලුත් හමු වූ විට සීතා සුනිල්ව ඇමතිය යුතු නෑදෑකම කුමක් ද?

(1) බාප්පා (2) මහප්පා (3) මාමා

20. ප්‍රශ්න පත්‍රයක ඇති මුළු ප්‍රශ්න සංඛ්‍යාව 20ක් වන අතර ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 100කි. එමෙන්ම වැරදි සෑම පිළිතුරක් වෙනුවෙන්ම ලකුණු 2ක් අඩුකරනු ලැබේ. ළමයෙකුගේ නිවැරදි පිළිතුරු සංඛ්‍යාව 16 ක් නම් ඔහු ලබාගත් ලකුණු සංඛ්‍යාව කීයද?

(1) 82 (2) 80 (3) 72

21. බිනුල තම නිවසේ සිට පාසලට පැමිණීමේදී ඔහුගේ දකුණු අත පැත්තෙන් ඔහුගේ සෙවණැල්ල පිහිටයි නම්, බිනුලගේ නිවස පිහිටා ඇත්තේ පාසලේ සිට කුමන දිශාවෙන් ද?

(1) දකුණු දිශාව (2) උතුරු දිශාව (3) බස්නාහිර දිශාව

22. ඉෂාදි ප.ව.7.30 සිට ප.ව. 9.30 තෙක් පාඩම් කළා ය. තරින්ද ප.ව. 8.10 සිට ප.ව. 9.00 තෙක් පාඩම් කළේ ය. සෙනුල ප.ව.6.30 සිට ප.ව. 8.30 තෙක් පාඩම් කළේ ය. තිදෙනාම එකවර පාඩම් කළ කාලය කොපමණ ද?

(1) මිනිත්තු 20 (2) මිනිත්තු 30 (3) මිනිත්තු 40

23. වෘත්තාකාර ධාවන පථයක යෙනුමි $\frac{1}{4}$ ක දුර ප්‍රමාණයක් දිවීමේදී සත්මි $\frac{1}{2}$ ක දුර ප්‍රමාණයක් දුවයි. සත්මි $\frac{1}{4}$ ක දුර ප්‍රමාණයක් දිවීමේදී, පවනි $\frac{1}{8}$ ක දුර ප්‍රමාණයක් දුවයි. ඒ අනුව පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) යෙනුමි වට $\frac{1}{2}$ ක දුර ප්‍රමාණයක් දුවන විට, සත්මි වට 2 ක් දුවයි.

(2) සත්මි වට $\frac{1}{2}$ ක දුර ප්‍රමාණයක් දුවන විට, පවනි වට $\frac{1}{4}$ ක් දුවයි.

(3) පවනි වට $\frac{1}{2}$ ක දුර ප්‍රමාණයක් දුවන විට, යෙනුමි වට 1 ක් දුවයි.

24. පන්තියක ගැහැනු ළමුන් ගණනට වඩා 12 ක් වැඩියෙන් පිරිමි ළමයි සිටිති. පන්තියේ සිටින මුළු ළමුන් ගණන 42ක් නම්, පන්තියේ සිටින ගැහැනු ළමුන් හා පිරිමි ළමුන් ගණන වන්නේ,

(1) 12, 30 (2) 30, 12 (3) 15, 27

25. ABLE , BYTE, MALT සහ EARL යන ඉංග්‍රීසි වචන හතර රහස් සංඥා ක්‍රමයකට ලියා ඇත්තේ 7425 , 1653, 4123, 3482 ලෙසය.(පිළිවෙළින් නොවේ.) ඒ අනුව 8526 නිරූපණය වන්නේ කුමකින් ද?

(1) RTLY (2) LATE (3) MEAL

26. සිසුන් පේළියක වම් කෙළවරේ සිට 16 වැන්නා යෙතුම් ය. එහි දකුණු කෙළවරේ සිට 18 වැන්නා ඔමේෂ් ය. යෙතුම්ගේ දකුණු පසින් 11 වැන්නා ඉදුවර ය. ඔමේෂ්ගේ දකුණු පසින් 3 වැන්නා වන්නේ ද ඉදුවරය. එම පේළියේ සිටින මුළු සිසුන් සංඛ්‍යාව කොපමණ ද?

(1) 41 (2) 42 (3) 45

27. බෙනුක ළඟ ඇති මුදලින් රුපියල් 500ක් සිතුම්ට දුන්නොත්, සිතුම් ළඟ ඇති මුදල දෙගුණ වන අතර බෙනුක ළඟ ඇති මුදල අඩක් වේ. ඔවුන් දෙදෙනාම ළඟ ඇති මුදල්වල එකතුව කීයද?

(1) රුපියල් 1000.00 (2) රුපියල් 1500.00 (3) රුපියල් 2000.00

28. සනුජ ළඟ ඇති මුදල් ප්‍රමාණය සයුල් ළඟ ඇති මුදලින් $\frac{3}{4}$ ක් වන අතර, මධුර ළඟ ඇති මුදලින් අඩකි. මධුර ළඟ ඇති මුදල් ප්‍රමාණය සයුල් ළඟ ඇති මුදලට වඩා අඩකින් වැඩිය. තිදෙනා ම සතු මුදල රු. 195.00 ක් නම්. මධුර ළඟ ඇති මුදල් ප්‍රමාණය කොපමණ ද?

(1) 45 (2) 60 (3) 90

29. පාතිමා 42 න් පටන් ගෙන අවරෝහණ පිළිවෙළට ගණන් කරයි. ඔමන්යා 12 න් පටන් ගෙන ඉරට්ටේ සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට ගණන් කරයි. දෙදෙනාම එකම වේලාවට ගණන් කිරීම ආරම්භ කර එකම වේගයෙන් ගමන් කරයි නම්, පළමුව දෙදෙනාම එකට ගණන් කරන සංඛ්‍යාව කුමක් ද?

(1) 30 (2) 32 (3) 34

30. පළමු බෑගයේ රතු පෑනක් සහ නිල් පෑන් 2ක් ද, දෙවන බෑගයේ රතු පෑන් 3 ක් සහ නිල් පෑනක් ද, තුන්වන බෑගයේ රතු පෑන් 2ක් සහ නිල් පෑන් 2ක් ද වන ලෙස බෑග් 3 ක් තුළ එකම වර්ගයේ රතු සහ නිල් පෑන් අසුරා ඇත. එක් බෑගයකින් පෑන් 2 බැගින් පෑන් 6 ක් ගනු ලැබුව හොත් ලැබිය හැකි උපරිම රතු පෑන් ගණන කීයද?


(1) 2 (2) 3 (3) 5

31. පහත දී ඇති හැඩතල අතරින් සමචතුරස්‍රාකාර හැඩයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය හැඩ තලවල ඉංග්‍රීසි අක්ෂර නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.




(1) A B C (2) A C D (3) B C D

32. පහත රූපවල සංඛ්‍යා යෙදී ඇති රටාව අනුව හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.



(1) 88 (2) 80 (3) 72

33. පහත දී ඇති රූප රටාවකට අනුව දක්වා ඇත. එහි හිස්තැනට යෙදිය යුතු රූපය තෝරන්න.




(1) (2) (3)

34. කොළඹ සිට අනුරාධපුර බලා ධාවනය වන පළමු බස් රථය පැයට කිලෝමීටර 40 ක සාමාන්‍ය වේගයෙන් ධාවනය වේ. ඊට පැයකට පසුව ගමන් අරඹන දෙවන බස් රථය පැයට කිලෝමීටර 60 ක සාමාන්‍යය වේගයකින් ධාවනය වේ නම්, බස් රථ දෙක හමුවන විට ගමන්කර ඇති දුර ප්‍රමාණය කොපමණ ද?

(1) 80 km (2) 120 km (3) 160 km

35. පහත දී ඇති රූපය කැරකැවූ විට දැකිය හැකි ආකාරය දැක්වෙන රූපය තෝරන්න.



(1) (2) (3)


36. වෘත්තාකාර මේසයක් වටා මිතුරන් හතර දෙනෙකු සහ ඔවුන්ගේ බිරින්දෑවරුන් වාඩිවී සිටින්නේ පිරිමියාට දකුණින් ඔහුගේ බිරිඳ වන පරිදි දුර සමාන වන ලෙසය. කමල්ට මුහුණාලා නිමල්ද නිමල්ට දකුණු පසින් කමලා ද සිටියි. කමලා සහ ලලනි අතර සිටින්නේ අනිල් වේ.ලලනි ඉදිරියෙන් සිටින්නේ රමණී නොවේ. සුනිල් සහ සීතා එක ළඟ වාඩිවී සිටිති. ලලනීට ඉදිරියෙන් වාඩිවී සිටින්නේ කවුද?

(1) සීතා (2) රමණී (3) සුනිල්

37. ප්‍රමිලාට සිටින සහෝදරයන් සහ සහෝදරියන් ගණන සමානය. ඇගේ මල්ලිට සහෝදරයන් ගණන මෙන් දෙගුණයක් සහෝදරියෝ සිටිති. මෙම පවුලේ පුතුන් කී දෙනෙක් සිටිත් ද?

(1) 2 (2) 3 (3) 4

38. පහත දී ඇති රූපයේ අංක 1 දැති රෝදය කරකැවෙන දිශාව හොඳින් නිරීක්ෂණය කර, අංක 4 සහ 5 දැති රෝද කරකැවෙන දිශාවන් සොයන්න.



(1) වමට, දකුණට (2) දකුණට, වමට (3) දකුණට, දකුණට

39. අංක 51 සිට 100 තෙක් අංක කරන ලද බෝල ප්‍රමාණයක් අතරින් අංක 73 සිට 92 දක්වා අංක සහිත බෝල කහ පැහැති වූ අතර අනෙක් බෝල සුදු පැහැතිය. කහ සහ සුදු පැහැති බෝල ගණන කොපමණද?

(1) 20, 30 (2) 21, 29 (3) 19, 31

40. පෙට්ටියක සබන් කැට 36 ක් හෝ කිරිපිටි පැකට් 16 ක් හෝ පමණක් ඇසිරීමට ඉඩ තිබේ. එම පෙට්ටියේ කිරිපිටි පැකට් 4ක් සමඟ සබන් කැට කීයක් ඇසිරිය හැකිද?

(1) 9 (2) 18 (3) 27

''නැණ සිළු - 2025''

පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට
පස් වන ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන විභාගය

කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - කුරුණෑගල

II පත්‍රය

කට්ටල අංක - 02

විභාග අංකය : .....

කාලය - පැය 01 මින්ත්තු 15 යි

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් .....

- ඔබගේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	

පිටු අංකය	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි.	V / II / S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි.	V / II / S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි.	V / II / S / EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය.	V / II / S / CH

සැකසුම :- තුෂාර සරත් කුමාර - 077 5154357

නන්දන රත්නායක - 071 8177327

කු/ වැල්ලව මධ්‍ය මහා විද්‍යාලය

01. පහත දැක්වෙන ඡේදය කියවන්න.

දිනිති පාසලේ දක්ෂ ශිෂ්‍යාවකි. ඇය රණබාහු මධ්‍ය මහා විද්‍යාලයේ 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන්නීය. මුතු කැට වැනි ඇගේ අත් අකුරු වලින් හැඩ වුණු නිර්මාණ රාශියක් පන්ති කාමරයේ දකින්නට ලැබේ. ඇය පසුගිය වසරේ සමස්ත ලංකා අත් අකුරු තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගත්තා ය. රණබාහු විද්‍යාලය ඇය වෙනුවෙන් උපහාර උත්සවයක් ද සංවිධානය කර තිබුණි. පාසලේ විදුහල්පතිතුමා පැවසුවේ ඈ මව්පියන් අහිමි මිත්තණිය ඇසුරේ හැදෙන වැඩෙන දැරියක් බවයි. එසේම ඇය අනම් මනම් කතා කරමින් කාලය ගත නොකරන බව විදුහල්පතිතුමා පැවසූවේය. පාසලේ ආදි ශිෂ්‍ය සංගමය මගින් ඇයට ශිෂ්‍යත්වයක් ද පිරිනැමීය. උපහාර උත්සවයේ ද කළ කතාවේ දී පැවසුවේ අනාගතයේ දී සිංහල භාෂා ගුරුවරියක් වී සිංහල භාෂාව රැක ගැනීමට කැපවෙන බවයි. බොහෝ දරුවන්ගේ බලාපොරොත්තු වලට වඩා ඇයට ඇත්තේ රටට ජාතියට ආදරය කරන බලාපොරොත්තුවක් බවත්, එය ඉතා අගය කරන බවත් විදුහල්පතිතුමා පැවසීය.

- ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

(1) දිනිති අධ්‍යාපය ලැබූ පාසල කුමක් ද?

.....

(2) දිනිතිගේ අනාගත බලාපොරොත්තුව වූයේ කුමක් ද?

.....

(3) මෙහි ඇති උපමාව කුමක් ද?

.....

(4) 'අකුරු' යන වචනයේ යෙදී ඇති පිල්ලම් පිළිවෙළින් නම් කරන්න.

.....

(5) මෙම ඡේදයේ ඇති යුගල පදයක් තෝරා ලියන්න.

.....

02. පහත පද්‍ය කොටස ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ඒ මල් වැස්සේ තෙමී තෙමී - පැළපත රැලි නඟනවාය
බණ්ඩි ඇදී කිරට හැරී - කරල් බිමට නැවෙන වා ය.

(1) පැළපත යන්නෙහි අරුත වන්නේ - .....

(2) බණ්ඩි ඇදී යන්නෙහි අරුත වන්නේ - .....

03. පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් "✔" ලකුණ ද වැරදි නම් "✘"ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(1) ගුරුවරු ඉතා කාරුණිකව ඉගැන්වීම් කටයුතු කරති. ( )

(2) නාත්තා උදෑසනම අවදි වී කුඹුරට යයි. ( )

(3) මද සුළඟ නිසා ගහ කොළ තාලයට සෙළවෙයි. ( )

(4) ඔවුන් සෙමින් රිය ධාවනය කරයි. ( )

(5) සිරි පොද වැස්සට තෙමීමට ළමයි ආසා කරති. ( )

04. බහුවචන පුරුෂලිංග වර්තමානකාල ක්‍රියා පදයක් තෝරා යටින් ඉරක් අඳින්න.

(1) බලති (2) බැලුවේ ය. (3) බැලූහ.

05. පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අක්ෂර සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) දුරකතනය, දුරකථනය, දුරකථණය

(2) ආපන ශාලාව, ආපණ ශාලාව, ආපණාශාලාව

(3) අවුරුල්ල අව්රැල්ල අවුරැල්ල

06. පහත සඳහන් වාක්‍ය ස්ත්‍රී ලිංග බහුවචනයට හරවා ලියන්න.

ඔහු පාසලේ වැඩවල නිරත වෙයි.

.....

07. පහත වචන නිවැරදි ව ගළපා වගන්තිය නැවත ලියන්න.

(1) කවුරුත් / පත් / කරමින්/ පුදුමයට/ ආවා / පණ/ ඈට/ අප

.....

(2) වස්තුහාමි/ ධනවත්/ ගොවියෙකු/ වූ/ පුද්ගලයෙකි/ කාර්යශූර

.....

08. පහත දැක්වෙන වගන්තියෙහි අදාළ ස්ථානවල විරාම ලකුණු යොදන්න.

❖ ලොකු අම්මා තාත්තාගේ ලොකු අයියාගේ බිරිඳ ඇගේ අභිංසක සිහිනවල සිටි අපුරුතම වීරවරියයි

09. පහත දැක්වෙන ඉඟි වැකියේ සහ ආප්තෝපදේශයට ගැළපෙන අර්ථය ලියන්න.

(1) අහසේ මාලිගා

.....

(2) ඇවිළෙන ගින්නට පිදුරු නොදමන්න

.....

10. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

1) Hoe ..... 2) Daughter .....

11. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.



☐☐☐☐☐



☐☐☐☐☐☐☐☐☐

12. පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

1) my / shirt/ This/ new/ is

.....

2) has/ garden/ She/ a/ beautiful

.....


13. පහත දෙමළ වචන සඳහා යෙදෙන සිංහල වචන ලියන්න.

ඉදෝ එඩුංගල් .....

14. පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

(1) ඔයාට වතුර ඕන ද?……...

15. ගණක රාමුවෙහි නිරූපිත සංඛ්‍යාවට 15ක් වැඩි සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.



……

16.

5	8
6	9

කොටුව තුළ ඇති සියලුම ඉලක්කම් යොදාගෙන 8 ඉලක්කමෙන් නිරූපිත අගය 800 ද 5 ඉගක්කමෙන් නිරූපිත අගය 5 ද වන ඉලක්කම් හතරේ සංඛ්‍යා දෙකක් ලියන්න.

……

17. පහත සංඛ්‍යා රටාව හඳුනාගෙන හිස්තැන් දෙකට ගැළපෙන සංඛ්‍යා දෙක ලියන්න.

…… …… 32 64 128 256

18. වෙළෙන්දෙක් ඇපල් ගෙඩි 48 කින් හතරෙන් එකක් $(\frac{1}{4})$ විකුණන ලදී. ඉතිරි ඇපල් ගෙඩි ගණන කීයද?

……

19. නිමල් වෘත්ත දෙකක් සහ සෘජුකෝණාස්‍රයක් යොදා ගෙන ඝන වස්තුවක් නිර්මාණය කරන ලදී. එහි ඇති

I. සමතල පෘෂ්ඨ …… II. වක්‍ර රේඛා ……

20. පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවය පැය 4 යි මිනිත්තු 45ක් පැවති අතර එය ප.ව.1.30 ට අවසන් විය. උත්සවය ආරම්භ වූයේ කීයට ද?

……

21. වෙළෙන්දෙක් එක් ගොවිපලකින් බිත්තර 4509 ක් ද, තවත් ගොවිපලකින් බිත්තර 3756 ක් ද මිලට ගන්නා ලදී. අනතුරුව එයින් බිත්තර 6700 ක් වෙළඳපොළට නිකුත් කරන ලදී. ඔහු ළඟ ඉතිරි බිත්තර ගණන කීයද?

……


22. වෙළඳසැලක තිබූ සීනි 25kg කින් 20kg 500ට විකුණූ වෙළෙන්දෙක් ඉතිරි සීනි ප්‍රමාණය 250g බැගින් පැකට් කරන ලදී. සෑදූ සීනි පැකට් ප්‍රමාණය කොපමණද?

……

23. ඇපල් පෙට්ටියක ගෙඩි 125 ක් ඇත. එවැනි පෙට්ටි 5ක් ගෙන ඇපල් ගෙඩි 6 බැගින් බෙදා දුන්නේ නම් කී දෙනෙකුට බෙදා දිය හැකිද?

……...

24.



I. මෙම රූපයේ පාට නොකළ ප්‍රමාණය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. ……..……..

II. පාට කළ කොටස භාග සංඛ්‍යාවක් සේ ලියන්න .....

25. පහතින් දැක්වෙන්නේ නගර අතර දුර දැක්වෙන සටහනකින් කොටසකි. නගර අතර දුර ප්‍රමාණය දක්වා ඇත්තේ km වලිනි.

				ත්‍රිකුණාමලය
			බණ්ඩාරවෙල	183
		බදුල්ල	32	167
	අනුරාධපුරය	277	163	196
අඹේපුස්ස	154	177	168	243

අඹේපුස්සේ සිට බණ්ඩාරවෙල හරහා ත්‍රිකුණාමලයට දුර කොපමණද? .....

26. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

I.


ද්‍රව්‍ය	1kg මිල		ප්‍රමාණය	ගෙවිය යුතු මුදල	
	රු	සත		රු	සත
සීනි	240	00	750 g	.....	.....
මුං ඇට	.....	.....	250 g	205	00
තේ කොළ	1200	00	.....	600	00
ගෙවිය යුතු මුදල				.....	.....

II. ඉහත මුදල ගෙවීමට රුපියල් 500.00 නෝට්ටු දෙකක් දුන්නේ නම් ලැබෙන ඉතිරි මුදල කීයද?

රුපියල් ..... සත .....

27. භාජනයක තිබූ පොල්තෙල් වලින් 15*l* 750*ml* ක් ප්‍රයෝජනයට ගත් පසු ඉතුරු වූ පරිමාව 8*l* 500*ml* කි. භාජනයේ මුලින් තිබූ පොල්තෙල් ප්‍රමාණය කොපමණද? ..... *l* ..... *ml*

28. පාසලක ඇති මිදුලක කොටසක් පහත රූප සටහනේ දැක්වේ.



I. 5 ශ්‍රේණිය පිහිටියේ ප්‍රධාන දොරටුවට කුමන දිශාවෙන්ද?

.....

II. ප්‍රධාන දොරටුවේ සිට බුදු මැදුරට ගොස් එතැන් සිට 5 ශ්‍රේණියට ගොස් නැවත ප්‍රධාන දොරටුවට යාමට දුර ප්‍රමාණය කිලෝමීටර හා මීටර වලින් ලියන්න.

.....km ..... m

❖ **ප්‍රශ්න අංක 29 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

- රූපයෙන් දැක්වෙන්නේ,

29. 

(1) කෝලම් රටාවකි
(2) බිත්ති සැරසිල්ලකි.
(3) මරතොණ්ඩි රටාවකි.

30. ‘‘ලංකාවේ කඳු සහ මිනිරන්’’ චාරිකා සංග්‍රහය ඉදිරිපත් කළ අපේ රටේ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් වන්නේ,

(1) ආතර් සී ක්ලාක් මහතා
(2) ඩී. බී. ජයතිලක මහතා
(3) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා

31. ශ්‍රී ලංකාවේ පෞරාණික ස්ථානවල ආරක්ෂාව භාරව කටයුතු කරන දෙපාර්තමේන්තුව වන්නේ,

(1) භූ විද්‍යා හා පතල් කාර්යාංශය
(2) පොලිස් දෙපාර්තමේන්තුව
(3) පුරා විද්‍යා දෙපාර්තමේන්තුව

32. ආය කටුව (හැට්ට කටුව) යොදාගෙන කරනු ලබන ක්‍රීඩාව වන්නේ,

(1) සමනළයෝ දළඹුවෝ
(2) මැණික සෙවීමේ ක්‍රීඩාව
(3) කටුව හැංගීම

33. විනිවිද පෙනෙන වීදුරුවක් ගෙන පස් ස්වල්පයක් එයට දමා, ජලය මිශ්‍ර කර කලතා තැබූ පසු එහි උඩින්ම ඇත්තේ,

(1) ලොම් පස (2) රොන් මඩ (3) හියුමස්

34. 

රූපයේ දැක්වෙන මිදිපොකුර නිර්මාණය කිරීමට යොදා ගත හැකි දෙයක් වන්නේ,

(1) පිල්බෝල (2) මුං ඇට (3) ටොනික් මූඩි

35. මාලිමාවක දර්ශකය සැමවිට ම යොමු වී ඇති දිශාව කුමක් ද?

(1) නැගෙනහිර - බටහිර
(2) උතුර - දකුණ
(3) වයඹ - ගිනිකොන

36. සර්පයකු දෂ්ට කළවිට අප විසින් නොකළ යුතු දෙයක් වන්නේ,

(1) දෂ්ට කළ ස්ථානය සබන් දමා සේදීම.
(2) දිවීම හෝ ඇවිදීම නොකර සිටීම.
(3) කට තබා විෂ උරා දැමීම

37. කහ පැහැති මල් පිපෙන ශාක වර්ගයක් නොවන්නේ,

(1) කනේරු (2) ඇහැල (3) එළබටු

38. ‘බැද්ද වටට සුදු මොරමල් පිපිලා’ කවිය අයත් වන්නේ,

(1) පැල් කවියකි (2) කරත්ත කවියකි (3) බඹර කවියකි

39. ගෙවතු වගාවේ භාවිත 3 R සංකල්පය වන්නේ,

(1) භාවිතය අවම කරමු, නැවත භාවිත කිරීම, ප්‍රතිසංස්කරණය


(2) භාවිතය වැඩි කරමු, නැවත භාවිත නොකරමු, ප්‍රතිචක්‍රීකරණය

(3) භාවිතය අවම කරමු, නැවත භාවිත කිරීම, ප්‍රතිචක්‍රීකරණය.

40. කුසගින්න නෙදැනීම, සම ඉරිතැලීම, කට කොන් වණ වීම වැනි රෝගී තත්වයන් ඇතිවන්නේ,

(1) විටමින් A අඩුවූ විට (2) විටමින් B අඩුවූ විට (3) විටමින් C අඩුවූ විට

41.



රූපයේ දැක්වෙන ඇටවුම ගලායන ජලපහරක් මගින් කරකැවීමට සැලැස්වූ විට, එහි වේගය වැඩි කිරීමට කළ හැක්කේ,

(1) පෙති ගණන වැඩි කිරීම.
(2) පෙති ගණන අඩු කිරීම.
(3) ජලයේ ගණාත්වය වැඩි කිරීම.

42. ශ්‍රී ලංකාවේ පිහිටි ස්වාභාවික වරාය සහ ගොඩ බිම කපා ඉදිකළ වරාය පිළිවෙළින් වන්නේ,

(1) කොළඹ වරාය, ගාලුවරාය (3) හම්බන්තොට වරාය. කොළඹ වරාය

(2) ත්‍රිකුණාමලය වරාය හම්බන්තොට වරාය

43. අධිවේගී මාර්ගයක ගමන්කළ හැකි උපරිම වේගය වන්නේ,

(1) 120 km (2) 80 km (3) 100 km

44. දැව කැපීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට යා යුත්තේ,

(1) පොලිසියට (3) ප්‍රාදේශීය සභාවට

(2) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට

45. පහත ක්‍රීඩා අතරින් ජන ක්‍රීඩාව නොවන්නේ,

(1) එල්ලේ (2) පංච දැමීම (3) වළකපු ගැසීම

46. පහත සඳහන් පිළිතුරු අතරින් උපකරණ දෙකක් එකම කර්මාන්තයක් සඳහා භාවිතා කරයි. එම පිළිතුර අඩංගු කාණ්ඩය තෝරන්න.

(1) මට්ටම් ලීය, කිණිහිර (2) අඟුරු කොක්ක, මිටිය (3) සල්ලඩය, සකපෝරුව

47. කාන්දම් කැබැලි දෙකක් විකර්ෂණය පෙන්නුම් කරන රූපය තෝරන්න,

(1) S N | S N

(2) S N | N S

(3) N S | N S

48. ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධාන ලුණු ලේවායක් පිහිටා ඇති ස්ථානය වන්නේ,

(1) කංකසන්තුරේ (2) නොරොච්චෝලේ (3) හම්බන්තොට

49. පලතුරු කෘත්‍රිම ලෙස ඉදවීම සඳහා යොදාගන්නා රසායනික ද්‍රව්‍ය වන්නේ,

(1) පිදුරු (2) ෆෝමලින් (3) කාබයිට්

50. මනු කියවන්නන් සම්බන්ධවන සේවාව වන්නේ,

(1) දුරකථන (2) විදුලිය (3) ප්‍රවාහන

51. ශරීරයට ශක්තිය ලබා දෙන ආහාර යුගලයක් වන්නේ,

(1) මස් මාළු (2) බත් පලාවර්ග (3) රොටී පාන්

52. ගංවතුරකින් පසුව ප්‍රදේශය පුරා පැතිරී යා හැකි වසංගත රෝගයකි.

(1) බරවා (2) කොරෝනා (3) සෙංගමාලය

53. වාහන අංක තහඩුවක මුලින්ම දක්වා ඇති ඉංග්‍රීසි අක්ෂර දෙකෙන් දැක්වෙන්නේ,

(1) දිස්ත්‍රික්කය (2) පළාත (3) රටයේ වර්ගය

54. නොරොච්චෝලේ ඉදිකළ තාප බලාගාරයේ නම යෙදෙන්නේ කෙසේද?

(1) ලක්ෂපාන (2) ලක්මිණ (3) ලක්විජය

55. රාත්‍රී කාලයේ වාහනයක් නවතා තබන විට ඉදිරිපස දැල්වෙන සංඥා ලාම්පුවේ වර්ණය වන්නේ,

(1) රතු (2) සුදු (3) තැඹිලි

56. වට්ටක්කා මලේ පාට වන්නේ,

(1) සුදු (2) කහ (3) දම්

57. අන් අය ඔබ සමග ගැළපෙන පුද්ගලයෙකු වීම සඳහා ඔබ විසින් පිළිපැදිය යුතු කරුණක් නොවන්නේ,

(1) තම අදහස් නිරවුල්ව තැනට යෝග්‍ය පරිදි හැරවීම.

(2) කෙනෙක් සමඟ කතා කරන විට සුහ පැතීම හා ස්තුතියි යනාදිය ගැන සැලකිලිමත් නොවීම.

(3) යහපත් වචන හා ඉරියව් පවත්වා ගැනීම.

58. මාංශ භක්ෂක සතෙකු නොවන්නේ,

(1) බත්කූරා (2) මී මැස්සා (3) දෙබරා

59. මෙම පියවර සූර්ය නමස්කාරයේ කීවෙනි පියවර ද?



01. පළමු පියවර
02. සිව්වන පියවර
03. හත්වන පියවර

60. මිනිසාට යහපත් ජීවිතයක් ගත කළ හැක්කේ පරිසරය ආරක්ෂා වුවහොත් පමණි. 'පරිසරයට ආදරය කරමු'' යන්න මාතෘකාව කරගනිමින් වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නො අඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)

01. ……
……

02. ……
……

03.……
……